සියලු ම හිමිකම් ඇවිරිණි / All Rights Reserved

සක්‍යා උසස් අධ්‍යාපන ආයතනය
Sakya Academy of Higher Education

SAP EXAMINATION

සක්‍යා උසස් පෙළ පෙරහුරු විභාගය 2022
**Sakya Advanced Level Preparatory Examination 2022**

**Final I**

ආර්ථික විද්‍යාව I
Economics I

**21 S I**

පැය එකයි
*One Hour*

**උපදෙස් :**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ **විභාග අංකය** ලියන්න.
* උත්තර පත්‍රයේ දී ඇති උපදෙස් ද සැලකිල්ලෙන් කියවා පිළිපදින්න.
* 1 සිට 25 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින්. **නිවැරදි හෝ ඉතාමත් ම ගැළපෙන හෝ** පිළිතුර තෝරාගෙන, එය **උත්තර පත්‍රයේ උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.**

01. සෑම සමාජයක් ම මූලික ආර්ථික ප්‍රශ්නවලට මුහුණ දෙනුයේ,
    (1) සෑම සමාජයක ම ජීවත්වන මිනිසුන්ට අසීමිත ආශාවන් පවතින නිසා.
    (2) ආර්ථික ප්‍රශ්න විසඳා ගැනීම වෙනුවෙන් ආර්ථික පද්ධති බිහි වී ඇති නිසා ය.
    (3) සෑම සමාජයකම ඉල්ලුමට සරිලන සැපයුම් ප්‍රවාහයක් කොහෙත්ම ලබා දිය නොහැකි නිසා ය.
    (4) සම්පත් හිඟවීම හා හිඟ සම්පත් වලින් විවිධ ප්‍රයෝජන ලබාගත හැකි නිසා ය.
    (5) සීමිත සම්පත්වලින් කොහෙත් ම වුවමනා සපුරා ගත නොහැකි නිසා ය.

02. අධ්‍යාපනය, පුහුණුව හා නිපුණතා සංවර්ධනය යන දෑ සඳහා රජය දරන වියදම් හේතුවෙන්,
    (1) ආර්ථිකයේ ශ්‍රම සම්පත, ප්‍රමාණාත්මක ව ඉහළ යනු ඇත.
    (2) ශ්‍රමිකයෙකුගේ සාමාන්‍ය ආයු කාලය වැඩි වනු ඇත.
    (3) ව්‍යවසායකයින්ගේ ප්‍රමාණය ඉහළ යනු ඇත.
    (4) යන්ත්‍ර සූත්‍ර භාවිතය ඉහළ යනු ඇත.
    (5) ශ්‍රමිකයෙකුගේ සාමාන්‍ය ඵලදාව ඉහළ යනු ඇත.

03. එක්තරා ආර්ථිකයක රජයේ එක ම කාර්යය වනුයේ, "දේපොළ හිමිකම තහවුරු කර දීම හා දේපොළ හිමිකම සුරක්ෂා කර දීම පමණක්" වේ. මෙම ආර්ථිකය,
    (1) ධනවාදී - වෙළෙඳ පොළ ආර්ථිකය කි.
    (2) සමාජවාදී - වෙළෙඳ පොළ ආර්ථිකය කි.
    (3) ධනවාදී - විධාන ආර්ථිකය කි.
    (4) සමාජවාදී - විධාන ආර්ථිකය කි.
    (5) සමාජයීය - වෙළෙඳ පොළ ආර්ථිකය කි.

04. එක්තරා ආර්ථිකයක නිෂ්පාදන හැකියා මායිම් වක්‍රය කාලයත් සමඟ දකුණට විතැන් වී ඇති ආකාරය පහත ප්‍රස්තාර සටහන නිරූපණය කරයි.




දෙවෙනි පිටුව බලන්න

නිෂ්පාදන හැකියා වක්‍රය දකුණට විතැන් වීමේ ප්‍රතිඵලය ලෙස X භාණ්ඩයේ හා Y භාණ්ඩයේ ආවස්ථික පිරිවැය,

| | X ඒකකයක ආවස්ථික පිරිවැය | Y ඒකකයක ආවස්ථික පිරිවැය |
|---|---|---|
| (1) | වැඩි වේ. | වැඩි වේ. |
| (2) | වැඩි වේ. | අඩු වේ. |
| (3) | අඩු වේ. | අඩු වේ. |
| (4) | අඩු වේ. | වැඩි වේ. |
| (5) | වැඩි වේ. | වෙනස් නොවේ. |

05. සංචරණ නීති ඉවත් කිරීමෙන් පසුව, අකර්මන්‍යව තිබූ ක්ෂේත්‍ර කඩිනමින් යථා තත්ත්වයට පත්වනු ඇතැයි ආර්ථික විශේෂඥයෝ අනාවැකි පළ කරති. මෙහි ප්‍රතිඵලය ලෙස,
   (1) නිෂ්පාදන හැකියා වක්‍රය සීඝ්‍රයෙන් දකුණට විතැන් වනු ඇත.
   (2) ප්‍රාග්ධන භාණ්ඩ නිපදවන අංශයේ සිට පරිභෝජන භාණ්ඩ නිපදවන අංශය වෙත සම්පත් මාරු වනු ඇත.
   (3) නිෂ්පාදන හැකියා වක්‍රය ඇතුළත සංයෝගයක සිට වක්‍රය දෙසට නිෂ්පාදන සංයෝගය විතැන් වනු ඇත.
   (4) ඇතුළට විතැන් වූ නිෂ්පාදන හැකියා වක්‍රය නැවත පෙර මට්ටමට ළඟා වනු ඇත.
   (5) නිෂ්පාදන හැකියා වක්‍රය ඇතුළත සංයෝගයක සිට තවත් ඇතුළත සංයෝගයකට මාරු වනු ඇත.

06. ටැබ් (Tab) පරිගණක සඳහාවන ඉල්ලුම් වක්‍රය දකුණට විතැන් වීමට බලපාන හේතුවක් වන්නේ,
   (1) ටැබ් (Tab) පරිගණකවල මිල ගණන් අඩු වීම.
   (2) ලැප්ටොප් (Laptop) පරිගණකවල මිල ගණන් සීඝ්‍රයෙන් වැඩි වීම.
   (3) ටැබ් (Tab) පරිගණක සැපයුම සීඝ්‍රයෙන් අඩු වීම.
   (4) ටැබ් (Tab) පරිගණක බාල භාණ්ඩයක්ව තිබිය දී පාරිභෝගික ආදායම වැඩි වීම.
   (5) ටැබ් (Tab) පරිගණක සඳහා පාරිභෝගික අභිරුචිය අඩු වීම.

07. එක්තරා භාණ්ඩයක සැපයුම් සමීකරණය $Qs = -100 + 10P$ ලෙස වේ. මෙම භාණ්ඩයේ මිල රු. 20.00 ත් 30.00 ත් අතර සැපයුම් නම්‍යතාව වනුයේ,
   (1) 2.0 (2) 1.67 (3) 1.5 (4) 2.1 (5) 1.8

08. එක්තරා භාණ්ඩයක ඉල්ලුම් වක්‍රය පහතින් දක් වේ.




මෙම භාණ්ඩයේ මිල රු. 20.00 ක් ලෙස තීරණය වී ඇතැයි සිතන්න. භාණ්ඩ වෙළෙඳ පොළේ සැපයුමේ සුළු අඩුවීමක් හේතුවෙන්,
   (1) අයභාරය වැඩි වේ.
   (2) අයභාරය වෙනස් නොවේ.
   (3) අයභාරය අඩු වේ.
   (4) අයභාරය මුල දී අඩු වී පසුව වැඩි වේ.
   (5) අයභාරය මුල දී අඩු වී පසුව ස්ථාවර වනු ඇත.

09. ආසන ගණන 500 කින් සමන්විත සිනමා ශාලාවක සෑම දිනකම එක්තරා දර්ශන වාරයක් සඳහා වන වෙළෙඳ පොළ ඉල්ලුම Qd = 750 - 15P වේ. තීරණය වී ඇති සමතුලිත මිල යටතේ මෙම සිනමා පටය නැරඹීමෙන්,
   (1) පාරිභෝගික අතිරික්තයක් හා නිෂ්පාදක අතිරික්තයක් හට නොගනී.
   (2) නිෂ්පාදන අතිරික්තය අපිරිමිත වේ.
   (3) පාරිභෝගික අතිරික්තයක් හට නොගන්නා අතර නිෂ්පාදක අතිරික්තයක් හට ගනී.
   (4) නිෂ්පාදක අතිරික්තයක් හට නොගන්නා අතර පාරිභෝගික අතිරික්තයක් හට ගනී.
   (5) පාරිභෝගික හා නිෂ්පාදක යන දෙපිරිසට ම අතිරික්තයන් හට ගනී.

10. තරඟකාරී බෝංචි වෙළෙඳ පොළේ, සමතුලිත මිල අඩු වී ඇති අතර, සමතුලිත ප්‍රමාණය වැඩි වී ඇත. මෙම ප්‍රතිඵල ලබා දෙන සිදුවීම් ඇතුළත් කාණ්ඩය කුමක් ද ?
   (1) බෝංචි සැපයුම හා ඉල්ලුම යන දෙකම අඩු වීම.
   (2) බෝංචි සැපයුම වැඩි වීම හා ඊට වැඩි වේගයකින් බෝංචි ඉල්ලුම අඩු වීම.
   (3) බෝංචි සැපයුම අඩු වීම හා ඊට වැඩි වේගයකින් බෝංචි ඉල්ලුම අඩු වීම.
   (4) බෝංචි සැපයුම වැඩි වීම හා ඊට අඩු වේගයකින් බෝංචි ඉල්ලුම අඩු වීම.
   (5) බෝංචි සැපයුම අඩු වීම හා ඊට වඩා වැඩි වේගයකින් බෝංචි ඉල්ලුම වැඩි වීම.

11. අත්‍යාවශ්‍ය භාණ්ඩයකට රජය උපරිම මිල නියම කරයි. ආර්ථික විද්‍යාව හදාරන ශිෂ්‍යයෙකු ලෙස රජයේ ඉහත ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ගය සාධාරණීයකරණය **කළ නොහැක්කේ** පහත කවරක් නිසා ද ?
   (1) එමඟින් භාණ්ඩයේ මිල අඩුවන බැවිනි.
   (2) එමගින් පාරිභෝගික අතිරික්තය වැඩි වන බැවිනි.
   (3) එමගින් නිෂ්පාදක අතිරික්තය අඩු වන බැවිනි.
   (4) එමගින් ආර්ථික ශුභ සාධනය අඩු වන බැවිනි.
   (5) එමගින් රජයේ වියදම වැඩි වන බැවිනි.

12. රජය, භාණ්ඩයක් මත පනවනු ලැබූ බද්දක ප්‍රතිඵලය ලෙස නව සමතුලිත මිල, ඒකක බද්දෙන් 60% ක තරම් ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇත. මෙම භාණ්ඩයේ බදු පැනවීමට පෙර සමතුලිත මිලේ දී,
   (1) ඉල්ලුම් නම්‍යතාව හා සැපයුම් නම්‍යතාව සමාන ය.
   (2) ඉල්ලුම් නම්‍යතාව, සැපයුම් නම්‍යතාවට සාපේක්ෂව අඩු ය.
   (3) ඉල්ලුම් නම්‍යතාව, සැපයුම් නම්‍යතාවට සාපේක්ෂව වැඩි ය.
   (4) ඉල්ලුම් නම්‍යතාව සැපයුම් නම්‍යතාව යන දෙක ම 1 ට වැඩි ය.
   (5) ඉල්ලුම් නම්‍යතාව හා සැපයුම් නම්‍යතාව යන දෙක ම 1 ට අඩු ය.

13. අතිරික්ත සැපයුම මිල දී ගැනීමේ රජයේ මිල ආධාරක වැඩ පිළිවෙළ යටතේ රජය දරන වියදම,
   (1) මුළුමනින්ම නිෂ්පාදක අතිරික්තයට එකතු වේ.
   (2) කොටසක් නිෂ්පාදක අතිරික්තයට ද, ඉතිරි කොටස පාරිභෝගික අතිරික්තයට ද එකතු වේ.
   (3) කොටසක් නිෂ්පාදක අතිරික්තයට හා පාරිභෝගික අතිරික්තයට එකතු වන අතර තවත් කොටසක් ආර්ථිකයට අහිමි වේ.
   (4) කොටසක් නිෂ්පාදක අතිරික්තයට එකතු වන අතර, ඉතිරි කොටස ආර්ථිකයට අහිමි වේ.
   (5) කොටසක් පාරිභෝගික අතිරික්තයට එකතු වන අතර ඉතිරි කොටස ආර්ථිකයට අහිමි වේ.

14. පහත දැක්වෙන රූප සටහනෙහි DD මගින් පෙන්නුම් කරනුයේ එක්තරා විශ්ව විද්‍යාලයීය ප්‍රජාවක් තුළ බස් සේවාව සඳහා පවතින ඉල්ලුම යි.




ගමන් වාරයක් සඳහා බස් ගාස්තුව OP වේ නම්, දිනකට සිදුවන ගමන් වාර සංඛ්‍යාව ON වේ. විශ්වවිද්‍යාල අධිකාරීන් විසින් බස් සේවාව නොමිලයේ ලබා දීමට තීරණය කරනු ලැබීම නිසා, ගමන් වාර සංඛ්‍යාව OM දක්වා වැඩි වේ නම් පාරිභෝගික අතිරික්තය කොපමණ ප්‍රමාණයකින් වෙනස් වේ ද?

(1) A සිට A + C දක්වා
(2) A සිට B + C දක්වා
(3) A සිට A + B + C දක්වා
(4) B සිට A දක්වා
(5) A + B සිට A + B + C දක්වා

15. ව්‍යාපාර ආයතනයක කෙටි කාලීන සාමාන්‍ය විචල්‍ය පිරිවැය වක්‍රය ඉහළට විතැන්වීමට බලපාන සිදුවීම පහත ඒවායින් කුමක් ද?

(1) බදුකුලිය ඉහළ යාම.
(2) වැටුප් අනුපාතික ඉහළ යාම.
(3) අමුද්‍රව්‍යවල ආනයන මිල අඩු වීම.
(4) ක්‍රමක්ෂය ගාස්තු ඉහළ යාම.
(5) නිෂ්පාදන ක්‍රියාවලිය හීනවන ඵලදා නීතියට යටත් වීම.

16. කෙටි කාලීන නිෂ්පාදන ක්‍රියාවලිය හීනවන ඵලදා නීතියට යටත් වන්නේ,

(1) සියලුම නිෂ්පාදන යෙදවුම් එකවර වැඩි කිරීම හේතුවෙනි.
(2) සියලුම විචල්‍ය යෙදවුම් සමජාතීය වීම හේතුවෙනි.
(3) විචල්‍ය යෙදවුම් සමජාතීය නොවන බැවිනි.
(4) සියලුම නිෂ්පාදන සාධක එකවර වැඩිකළ නොහැකි බැවිනි.
(5) ස්ථාවර යෙදවුම් සමඟ විචල්‍ය යෙදවුම් වැඩිකළ නොහැකි බැවිනි.

17. පූර්ණ තරඟකාරී ආයතනයක් සම්බන්ධයෙන් පහත විස්තර සපයා ඇත.

| | | |
|---|---|---|
| භාණ්ඩයේ මිල | රු. | 40.00 |
| අලෙවි ප්‍රමාණය | (ඒකක) | 500 |
| මුළු ස්ථාවර පිරිවැය | රු. | 5000 |
| සාමාන්‍ය විචල්‍ය පිරිවැය | රු. | 35.00 |

මෙම ව්‍යාපාර ආයතනය අඛණ්ඩව පවත්වාගෙන යාම තුළින්,

(1) රු. 2500 ක අලාභයක් ඇති වීම.
(2) රු. 2500 ක ලාභයක් ඇති වේ.
(3) රු. 5000 ක අලාභයක් ඇති වේ.
(4) රු. 5000 ක ලාභයක් ඇති වේ.
(5) ආර්ථික ලාභය ශූන්‍ය වේ.

18. ඒකාධිකාරී තරඟය හා කතිපයාධිකාරය යන වෙළෙඳ පොළ ව්‍යුහවල ලක්ෂණ පහත වගුවෙන් සන්සන්දනාත්මකව ඉදිරිපත් කරයි. ඒවා අතරින් ඔබට **එකඟ විය නොහැකි** කරුණ වනුයේ,

| | ඒකාධිකාරී තරඟය | කතිපයාධිකාරය |
|---|---|---|
| (1) | ප්‍රවේශය බාධාකාරී නො වේ. | ප්‍රවේශය බාධාකාරී වේ. |
| (2) | නිෂ්පාදිතය ප්‍රභේදිත වේ. | නිෂ්පාදිතය ප්‍රභේදිත හෝ සමජාතීය වේ. |
| (3) | ආයතන අතර අන්‍යෝන්‍ය රැඳියාවක් ඇත. | ආයතන අතර අන්‍යෝන්‍ය රැඳියාවක් නැත. |
| (4) | ඉල්ලුම් වක්‍රය පහතට බෑවුම් වේ. | ඉල්ලුම් වක්‍රය පහතට බෑවුම් වේ. |
| (5) | තනි ආයතනයක් මිල තීරකයෙකු වේ. | තනි ආයතනයක් මිල තීරකයෙකු වේ. |

19. ශ්‍රී ලංකාවේ නිමැවුම් ප්‍රවේශයට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී එකතුකළ අගය ගණනය කරනුයේ,

(1) වෙළෙඳ පොළ මිල ගණන් යටතේ වේ.
(2) මූලික මිල ගණන් යටතේ වේ.
(3) නිෂ්පාදකයාගේ මිල ගණන් යටතේ වේ.
(4) සාධක පිරිවැය මිල ගණන් යටතේ වේ.
(5) ගැණුම්කරුගේ මිල ගණන් යටතේ වේ.

20. SNA - 2008 ප්‍රමිතයට අනුව රටක වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය ගණනය කිරීමේ දී ඇතුළත් **නොකරන** ආර්ථික කටයුතු පහත ඒවායින් කවරක් ද?
(1) නිවසේ මෙහෙකරුවෙකුට වැටුප් ගෙවීම.
(2) ආයෝජකයෙකුට, සිය ආයෝජනය සඳහා ලාභාංශයක් ලැබීම.
(3) නිෂ්පාදන ආයතනයක් වාණිජ බැංකුවකින් රුපියල් මිලියනයක ණයක් ලබා ගැනීම.
(4) පැරණි මෝටර් රථයක් අලෙවි කිරීමෙන් තැරැව්කරුවෙකු කොමිස් ආදායමක් උපයා ගැනීම.
(5) පෞද්ගලික නිවාස අයිතිය.

21. කිසියම් වර්ෂයක දී රටක දේශීය ඉතුරුම් රුපියල් මිලියන 6000 ක් වූ අතර, එම රටේ ආයෝජන මට්ටම රුපියල් මිලියන 8000 ක් ද, ජාතික ඉතුරුම් රුපියල් මිලියන 7500 ක් ද, පැවති අතර මෙම ආර්ථිකයේ ශුද්ධ අපනයන හා ගෙවුම් තුලන ලේඛණයේ ජංගම ගිණුමේ ශේෂය වනුයේ,

| | ශුද්ධ අපනයන රු. මි. | ජංගම ගිණුමේ ශේෂය රු. මි. |
|---|---|---|
| (1) | - 2000 | + 1500 |
| (2) | - 2000 | - 500 |
| (3) | + 2000 | - 500 |
| (4) | - 1500 | - 500 |
| (5) | - 500 | + 2000 |

22. වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය දී ඇති විට වැයකළ හැකි දළ ජාතික ආදායම ලබාගත හැකි ආකාරය නිවැරදිව දක්වා ඇත්තේ පහත කවරක් මගින් ද?

(1) = වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය + ගෙවුම් තුලන ජංගම ගිණුමේ ශේෂය - ශුද්ධ අපනයන
(2) = වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය + ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම - ශුද්ධ විදේශ ජංගම සංක්‍රාම
(3) = වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය + ගෙවුම් තුලන ජංගම ගිණුමේ ශේෂය + ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම
(4) = වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය - ශුද්ධ අපනයන + ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම + ශුද්ධ විදේශ ජංගම සංක්‍රාම
(5) = වෙළෙඳ මිලට දළ දේශීය නිෂ්පාදිතය + ගෙවුම් තුලන ජංගම ගිණුමේ ශේෂය + ශුද්ධ විදේශ ජංගම සංක්‍රාම

23. කිසියම් ආර්ථිකයකට අදාළ සාර්ව ආර්ථික දත්ත පෙළක් පහතින් දැක් වේ.

| | රු. බිලියන |
|---|---|
| ශුද්ධ මෙහෙයුම් අතිරික්තය | 1500 |
| ශ්‍රමිකයින්ගේ ඉපැයීම් | 4000 |
| මිශ්‍ර ආදායම් | 1000 |
| ස්ථාවර ප්‍රාග්ධන පරිභෝජනය | 500 |
| නිෂ්පාදනය මත අනෙකුත් ශුද්ධ බදු | 400 |
| භාණ්ඩ හා සේවා මත ශුද්ධ බදු | 1100 |
| ශුද්ධ විදේශ ප්‍රාථමික ආදායම | - 500 |

මෙම ආර්ථිකයේ ශුද්ධ ජාතික ආදායම වන්නේ රු. බිලියන,

(1) 7500 කි. (2) 8000 කි. (3) 6500 කි. (4) 7100 කි. (5) 7900 කි.

24. කල්පිත ආර්ථිකයක සමාහාර පරිභෝජන ශ්‍රිතය $C = 500 + 0.8Yd$ ලෙස දී ඇත. මෙම ආර්ථිකයේ එකවර අයකරන බදු රුපියල් බිලියන 300 ක් ද, කුටුම්බ වෙත ලබා දෙන සංක්‍රාම රුපියල් බිලියන 50 ක් ද, ලෙස පවතී. සමතුලිත ජාතික ආදායම රුපියල් බිලියන 4000 දී ඉතුරුම් වන්නේ,

(1) රුපියල් බිලියන 250
(2) රුපියල් බිලියන 1000
(3) රුපියල් බිලියන 500
(4) රුපියල් බිලියන 750
(5) රුපියල් බිලියන 1250

25. කිසියම් ආර්ථිකයකට අදාළව පහත විස්තර සපයා ඇත. (සියලුම සංඛ්‍යා රුපියල් බිලියන වලිනි.)

| | | |
|---|---|---|
| දළ දේශීය නිෂ්පාදිතය | (Y) | 8000 |
| වැයකළ හැකි ආදායම | (Yd) | 7500 |
| ඉතුරුම් | (S) | 400 |
| ශුද්ධ ආනයන | (Nm) | 200 |
| අයවැය හිඟය | (BD) | 100 |

මෙම ආර්ථිකයේ ආයෝජනය වනුයේ,

(1) රුපියල් බිලියන 300
(2) රුපියල් බිලියන 500
(3) රුපියල් බිලියන 700
(4) රුපියල් බිලියන 200
(5) රුපියල් බිලියන 600

සැකසුම ඃ බණ්ඩාර දිසානායක
B.Sc.(Mgt)Sp